**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2023**

**-------------------------------------------------------**

පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධන සඳහා වූ කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹි අංක 886 දරණ ණය ගිවිසුමෙ 01 වගන්තිය හි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර, සබරගමුව, නැඟෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම සහ උතුරු පළාත් වල මඟී සහ භාණ්ඩ ප්‍රවාහන ඉල්ලුම වර්ධනය වීමට මුහුණ දීම සඳහා සහ වාහන මෙහෙයුම් සහ මාර්ග නඩත්තු වියදම්, ප්‍රවාහන කාලය සහ අනතුරු අවම කිරීම මගින් අදාළ ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම සඳහා පදික උරහිස් සහිත මංතීරු දෙකකින් සමන්විත පාලම් 25 ක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැකේජය 01, 02 සහ 03 යන සංරචක තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 4,632 කට සමාන එ.ජ.ඩො. මිලියන 35.41 ක් වන අතර අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 සැප්තැම්බර් 07 දින ආරම්භ කළ අතර 2017 සැප්තැම්බර් 05 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය මුලින් 2019 දෙසැම්බර් 31 දින දක්වාත් පසුව 2023 දෙසැම්බර් 31 දින දක්වාත් දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම 2.1 යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 07 හි 62 වගන්තියට අනුව, එක් එක් කාල පරිච්ඡේදය සඳහා ක්ෂයවීම් වෙනත් වත්කමක ධාරණ අගයට ඇතුළත් කර නොමැති නම් එය අතිරික්තයක් හෝ ඌනතාවයක් ලෙස හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1.35 ක් වූ ක්ෂයවීම් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1.35 | එකඟ වී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 07 වගන්තියට අනුව, ගනුදෙනු සහ සිද්ධීන් ගිණුම් වාර්තාවල සටහන් කළ යුතු අතර ඒවා අදාළ කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දරන ලද රු. මිලියන 5 ක වියදම සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයහි වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයහි වියදම් ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | 5 | එකඟ වී ඇත. | -එම- |
| (ඇ) | තලවතුගොඩ මාර්ගයේ අංක. ¾ පාලමෙහි කැණීම් කටයුතු සඳහා මුදල් ගෙවීම් සම්බන්ධයෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය සහ ඉදිකිරීම් සමාගමක් අතර ආරවුලක් ඇතිව තිබුණි. ආරවුල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව, ආරවුල් අංක. 2 සහ අංක. 3 සඳහා කොන්ත්‍රාත් ගිවිසුමට අනුව අයකිරීම් සහ මූල්‍ය ගාස්තු ලෙස රු. මිලියන 9.4 ක් ගෙවීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත උපදෙස් ලබාදී තිබුණි. කෙසේ වෙතත්, ඉහත ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කටයුතු කර නොතිබුණි. | 9.4 | ආරවුල් බේරුම්කරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද මුදල සහ ඒ සඳහා ප්‍රමාද ගාස්තු අතුරු ගෙවීම් ඉල්ලුම්පත්‍ර අංක. 30 සහ 31 හි ඇතුළත් කර ඇති අතර අතුරු ගෙවීම් ඉල්ලුම්පත්‍ර 31 2024 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදී. එබැවින් අතුරු ගෙවීම් ඉල්ලුම්පත්‍ර 30 හි ඇති මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හිඟහිටි ගෙවීම් ලෙස සඳහන් කර තිබුණි. | සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවයකින් සහ අනුමැතියකින් තොරව 2018 වර්ෂයේදී ප්‍රධාන පාලම් ඉදිකිරීම් (MBC) ව්‍යාපෘතියට අරමුදල් මාරු කර තිබුණි. ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී ඇවර කර තිබුණද, | 10 | එකඟ වී ඇත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් අනුමත නොකළ ගෙවීම් පිළිබඳව නිසි පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇවර කිරීමට පෙර මුදල් අයකර ගැනීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය ක්‍රියා කර නොතිබුණු අතර එම මුදල තවමත් ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | | | |
| (ඉ) | 2022 ජූනි 08 සිට 2022 සැප්තැම්බර් 27 දින දක්වා අන්තර් ගෙවීම් සහතික 14 ක් විදේශ ණය නියෝජිතායතනයට ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන තුරු එම මුදල ණය නියෝජිතායතනය විසින් ගෙවා නොතිබුණි. එබැවින් කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානමක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීම් හෝ හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | 252 | එකඟ වී ඇත. | සියලුම ගනුදෙනු සහ සිද්ධීන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව සටහන් කළ යුතුය. |
| (ඊ) | ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි සඳහා වන පොලිය වගකීමක් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට හඳුනාගෙන නොතිබුණි. | 20.6 | එකඟ වී නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ගෙවීමක් 2023 වසර තුළ ව්‍යාපෘතිය මගින් සිදු කර නොමැත. මෙම සියලු කටයුතු මා.සං.අ. යේ අධ්‍යක්ෂ (ඉඩම්) විසින් සිදු කර ඇත. එබැවින් අවසාන මූල්‍ය ප්‍රකාශවල වගකීම් කිසිවක් සඳහන් කර නොමැත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ඇවර කරන තෙක් ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා ගෙවීම් ව්‍යාපෘතියේ ඇවර කිරීම් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කෙරේ. | සියලුම ගනුදෙනු සහ සිද්ධීන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව සටහන් කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 උප වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු බවට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණු | එකඟ වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඇ) වගන්තියට අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපෘතිය තුළ පවත්වා ගතයුතු |

| | | | |
|---|---|---|---|
| | අතර 2019 සිට 2023 දක්වා මෙහෙයුම් කමිටු රැස්වීම් අටක් පමණක් පවත්වා තිබුණි. | | අතර එවැනි පද්ධතියක ඵලදායීතාවය අධීක්‍ෂණය කිරීම සඳහා වරින් වර සමාලෝචන සිදු කර ඒ අනුව ලිඛිත උපදෙස් ලබාදිය යුතුය. |

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **කොන්ත්‍රාත් පරිපාලනය**

| **අංකය** | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පැකේජ 03 යටතේ පාලම් හතරක කොන්ත්‍රාත් කාලය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, දින දීර්ඝ කළ කාලය තුළ කොන්ත්‍රාත්කරු වැඩ නිම කර නොතිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුව තවදුරටත් සිදුව ඇති ප්‍රමාදයන් සඳහා කාල දීර්ඝ කිරීම් ඉංජිනේරුවරයා විසින් අනුමත කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තියට අනුව 2022 ජූලි 07 දින දක්වා ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 27 ක මුදලක් ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කිරීමට පෙර අතුරු ගෙවීම් සහතික වලින් අඩු කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කටයුතු කර නොතිබුණි. | එකඟ වී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කාලය දීර්ඝ කිරීම් ඇගයීම සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවා යෝජක ලෙස මා.සං.අ. හි සභාපතිවරයා සහ එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් පැකේජ 3 හි ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණද, කොන්ත්‍රාත් ගිවිසුමේ 8.8 වගන්තියට අනුව කොන්ත්‍රාත් අත්හිටුවීමේ තීරණය මා.සං.අ. හි අධ්‍යක්ෂ ජනරාල් විසින් ගෙන තිබුණි. එබැවින් සේවායෝජකයා වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා ගත් තීරණයේ වලංගුතාවය ගැටලු සහගත විය. කොන්ත්‍රාත් අත්හිටුවීම හේතුවෙන් කාල දීර්ඝ කිරීම් ලබා දීමට, අත්හිටුවීමේ කාලය තුළ විචලන සහ හානිවීම් සඳහා ගෙවීම් කිරීමමේ වගකීම සේවා යෝජක වෙත පැවරෙනු ඇත. | එකඟ වී ඇත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ඇ) | විදේශ ණය නියෝජිතායතනයේ එකඟතාවයට යටත්ව කැබිනට් අමාත්‍යවරුන් විසින් ගනු ලබන තීරණයකට අනුව නව පාලම් 13 ක් පාලම් 25 හි මූලික ලැයිස්තුවට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටද එවැනි වෙනස්කම් සඳහා එකඟතාවය ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ලබාගෙන නොතිබුණි. | එකඟ නොවේ<br>මුල් පාලම් ලැයිස්තුවෙහි පාලම් 8 ක් පැකේජය 01 හි ඇතුළත් කර ඇත. 02 සහ 03 පැකේජවල සමහර පාලම් සංශෝධනය කර ඇති අතර සංශෝධිත පාලම් ලැයිස්තුවේ විස්තර ණය නියෝජිතායතනයට දන්වා ඇත. ලංසු | අදාල වෙනස්කම් සඳහා ණය නියෝජිතායතනයේ නිසි එකඟතාවය විගණනයට ඉදිරිපත් කර නොතිබුණු එබැවින් අදාල ලියකියවිලි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපෘතිය තුළ පවතින බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලේඛන අනුමත කර සංශෝධිත පැකේජ 03 සහ පැකේජ 02 සඳහා වෙන වෙනම ණය නියෝජිතායතනයේ එකඟතාවය ලබාගෙන ඇත. | |

**3.2 පද්ධති හා පාලන**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල අතර අත්සන් කරන ලද ගිවිසුමට අනුව, මූලික ව්‍යාපෘති කාලය 2014 ජනවාරි 30 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වසර 05 කි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2023 දෙසැම්බර් 31 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි. පසුගිය වසර 10 තුළ මුළු ණය මුදලින් සියයට 66 ක් වූ කුවේට් ඩිනාර් (KWD) මිලියන 6.6 කට සමාන රු. මිලියන 4,128 ක් භාවිතා කර තිබුණි. ශ්‍රී ලංකා ආර්ථිකයේ අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියට එහි කටයුතු කිරීමට සිදු වූ බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස මූලික සැලැස්මට අනුව ව්‍යාපෘතිය නිම කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට නොහැකි වූ අතර ණය නියෝජිතායතනය විසින් 2022 ජුනි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය මුදල අත්හිටුවා තිබුණි. එබැවින්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ නොවේ<br>නොවැළැක්විය හැකි විවිධ හේතු නිසා ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සිදු විය.<br>I. දුර්වල කාර්ය සාධනය හේතුවෙන් පැකේජ 01 හි උපදේශක කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම.<br>II. අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල (KFAED) විසින් එකඟතාව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පැකේජ 2 හි සිවිල් වැඩ කොන්ත්‍රාත් ප්‍රසම්පාදනය නැවත සිදු කිරීම.<br>III. කොවිඩ්-19 බලපෑම්.<br>IV. ආර්ථික අර්බුද. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිකිරීම් කළමණාකරණ දුර්වලතා පිළිබඳව නිසි විමර්ශනයක් පවත්වා ව්‍යාපෘතිය තුළ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බවට සහතික විය යුතුය. |
| (ආ) | 2018 දී කිසිදු ලිඛිත ගිවිසුමකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු. මිලියන 1.95 ක මුදලක් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ලබාගෙන තිබුණු අතර මා.සං.අ. සමඟ කිසිදු ගිවිසුමකින් තොරව සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ණය කපා හැරීමේ ගිණුම යටතේ වාර්තා කර තිබුණි. | එකඟ නොවේ<br>වන්දි ගෙවීම් පියවීම සඳහා මා.සං.අ. වෙතින් රු. මිලියන 1.95 ක ණය මුදලක් ලබාගෙන ඇත. එම ණය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල මා.සං.අ. වෙත ගෙවිය යුතු ණයක් ලෙස හඳුනාගෙන ඇති අතර මුළු ණය මුදල මා.සං.අ. විසින් පියවා ඇති බව දන්වන ඇති බැවින්, රු. මිලියන 1.93 ක් වූ එම ගෙවිය යුතු ශේෂය ණය කපා හැරීමේ ගිණුමට මාරු කර ඇත. | ජර්නල් වවුචර් ගැලපීමට පෙර ගණකාධිකාරීවරයා නිසි අනුමැතිය ලබා ගත යුතුය. මූල්‍ය වාර්තාකරණය වැරදි ලෙස හැසිරවීම පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නිසි පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පැකේජය 1,2,3 සහ 4 යටතේ ඉඩම් කැබලි 158 ක් අත්කර ගැනීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් සැලසුම් කර තිබුණද ඉඩම් කැබලි 81 ක තොරතුරු පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. එබැවින්, එක් එක් ඉඩම් කැබලි වල ප්‍රමාණය පිළිබඳ විස්තර ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් නඩත්තු කර නොතිබුණු අතර ඉතිරි ඉඩම් කැබලි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ නොවේ<br>ඉහත කැබලි වල සියලුම විස්තර මා.සං.අ. හි ඉඩම් අංශයේ ඇත. | සියලු තොරතුරු ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ඉඩම් අත්පත් කර ගැනීමට අදාලව පොලී ගෙවීමට රු. මිලියන 40.58 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණු අතර එම මුදලින් රු. මිලියන 27.74 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ ගෙවිය යුතුව තිබුණි. 2023 වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි සහ පොලී ගෙවීමට අයවැයෙන් රු. මිලියන 5 ක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වන්දියක් සහ පොලියක් ගෙවීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් පියවර ගෙන නොතිබුණි. | එකඟ නොවේ<br>ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය 2023.03.31 දක්වා ක්‍රියාත්මක විය. මෙම මාස 3 තුළ වන්දි ගෙවීමට කිසිදු අක්මුදලක් ලැබී නැත. සියලුම වන්දි ගෙවීම් මා.සං.අ. හි නි.අ.ජ. (ඉඩම් කළමනාකරණ) විසින් 2023.03.31 දිනෙන් පසුව සිදු කරන ලදී. | මූල්‍ය ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ සියලු ගනුදෙනු සහ සිද්ධීන් සටහන් කළ යුතුය. |
| (ඉ) | ණය නියෝජිතායතනය විසින් ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලැබූ තීරණය මත පදනම්ව 2023 මාර්තු 31 දින ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වසා දමා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් 2023 මාර්තු සිට 2024 මාර්තු දක්වා කාර්යාල ගොඩනැගිල්ලේ මාසික කුලිය ලෙස රු. මිලියන 5.81 ක් ගෙවා තිබුණි. එබැවින් රජයේ ප්‍රතිපත්තියට අනුකූල වීමෙන් තොරව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ නොවේ<br>2023.03.31 දින දක්වා අඩු කාර්ය මණ්ඩලයක් පවත්වා ගෙන යන ලදී. ණය සාකච්ඡා සාර්ථක වී ඉක්මනින් ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට බලාපොරොත්තු විය. එබැවින් කාර්යාලය අවම කාර්ය මණ්ඩලයක් යටතේ පවත්වා ගෙන යන ලදී. | නිසි අනුමැතියකින් තොරව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය 2023 මාර්තු 31 දිනෙන් පසුව පවත්වා නොගත යුතුය. |